www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ මැතිවරනයේ ජාත්‍යන්තර අර්ථභාරය

## The international significance of the Sri Lankan election

2010 අප්‍රේල් 06

ශ්‍රී ලංකාවේ අප්‍රේල් 8 මහ මැතිවරනයේ ක්ෂනික ප්‍රතිඵලය කුමක් වුව ද එය සන්ධිස්ථානයක් සලකුනු කරනු ඇත. සිවිල් යුද්ධයේ 25 වසරක් තුල ගොඩ නගා තිබෙන පොලිස්-රාජ්‍ය තන්ත්‍රය යොදා ගෙන ජනාධිපති මහින්ද රාජපක්ෂ රටේ ආර්ථික අර්බුදය වැඩ කරන ජනතාවගේ කරපිටට පැටවීමට උත්සාහ කරනු ඇත.

දැන් ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක වෙමින් පවතින්නේ ලෝකය පුරාම පාලක පන්තීන්ගේ වැඩපිලිවෙලේ තියුනු ම ප්‍රකාශනයකි. 2008 භූගෝල පරිමාන මූල්‍ය අර්බුදයට ප්‍රතිචාර වශයෙන් ලෝකයේ ආන්ඩු, ඩොලර් ට්‍රිලියන ගනන් බැංකු නය තම ගනන්හිලව් පොත්වලට ඇතුල් කරගෙන එම නයට කරගැසූ අතර දැන් එම මුදල් කම්කරු පන්තියෙන් මිරිකා ගැනීමට ඔවුන්ට සිදුව තිබේ. රාජ්‍ය සේවාවන් කඩා බිඳ දැමීම, වැටුප් සහ රැකියා කප්පාදු කිරීම සහ බදු ඉහල දැමීම සම්බන්ධයෙන් ග්‍රීසිය උරගල ලෙස යොදා ගනු ලබයි. එවන් ප්‍රහාර ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ක්‍රියාවට දැමිය නොහැකි බවට ශ්‍රී ලංකාව අනතුරු හැඟවීමකි.

පසුගිය මැයි මාසයේ එල්ටීටීඊ සංවිධානය පරාජය කිරීමෙන් කෙලවර කෙරුනු ආන්ඩුවේ යුද්ධය මගින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය විනාශ කර දමනු ලැබ ඇත. ගෝලීය අවපාතය පුපුරා යාම රටේ අපනයනයන්ට දැවැන්ත පහරක් එල්ල කල අතර රාජපක්ෂට තම යුද්ධය සඳහා දැවැන්ත නය මුදලක් ගැනීමට සිදුවිය. පසුගිය ජූලි මාසයේ ගෙවුම්ශේෂ අර්බුදයකට මුහුන දුන් ඔහුට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල දෙසට හැරී ඩොලර් බිලියන 2.6ක නයක් ලබා ගැනීමට සිදුවිය.

ඉන් පසු නියමිත කලට අයවැය ලේඛනයක් ඉදිරිපත් නොකල ආන්ඩුවට දැන් සිදුවී තිබෙන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඉල්ලීම්වලට යටත්ව 2011 වනවිට අයවැය හිඟය හරි අඩකින් කපා දැමීමට ය. ආන්ඩුවේ වියදමින් තුනෙන් පංගුවක් ම නය ගෙවීමට යට වී ඇත. තවත් සියයට 21 ක් යුද හමුදාව සඳහා වෙන් වේ. යුද්ධයෙන් පසු හමුදා කොටස් විසුරුවා හැරීමට බලාපොරොත්තුවක් රාජපක්ෂට ඇත්තේ නැත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් නියම කරන ලද සීමාව ක්‍රියාත්මක කල හැක්කේ වැඩ කරන ජනතාවගේ ජීවන තතු මහා පරිමානයෙන් කපා හැරීම මගින් පමනි. මෙවැනි විනාශකාරී පියවර ගැනීමට සිදු වී ඇත්තේ නිල දරිද්‍රතා මට්ටම මාසයකට ඩොලර් 27 (රුපියල් 3078 ක්) මට්ටමට වැටී පවත්නා තතු තුල ය.

ඕනෑම විරුද්ධත්වයක් නීති විරෝධී යැයි තැකීමට ආන්ඩුව පටන් ගෙන තිබේ. පසුගිය සෙනසුරාදා ජනාධිපතිගේ සහෝදරයා වූ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජක්ෂ මෙසේ ප්‍රකාශ කලේ ය. "මීලඟ පාර්ලිමේන්තුව බෙදුම්වාදය සහ ත්‍රස්තවාදය පෝෂනය කරන සියලුම දේශපාලන පක්ෂ තහනම් කිරීමට නීති සම්මත කල යුතු ය." එවන් තහනමක් පලමුවෙන් එල්ල වනු ඇත්තේ දෙමල බෙදුම්වාදය හෝ ස්වයං පාලනය සුදුසු යැයි කියා සිටින පක්ෂ වලට එරෙහිව ය. එහෙත් දැනටම විරුද්ධවාදී පක්ෂ සියල්ල "ජාත්‍යන්තර කුමන්ත්‍රනයක කොටස්කරුවන් ය"යි චෝදනා කර සිටින ආන්ඩුව එවන් තහනමක් සියලුම විරුද්ධ පක්ෂයන්ට එරෙහිව යෙදවීමට වැඩිකල් නොයනු ඇත.

ජනවාරි මාසයේ ජනාධිපතිවරනයෙන් පසුව ආන්ඩුව ප්‍රධාන විරුද්ධ පක්ෂ තරගකරුවා වූ විශ්‍රාමික ජෙනරල් සරත් ෆොන්සේකා සහ ඔහුගේ සහකරුවන් දුසිම් ගනන් අත්අඩංගුවට ගත්තේ ඔවුන් කුමන්ත්‍රනයක කොටස්කරුවන් යැයි බොරු චෝදනා නගමිනි. ගත වූ මාස දෙක තුල

විරුද්ධවාදී මාධ්‍යවේදීන් ගනනාවක් අත්අඩංගුවට ගෙන හෝ අතුරුදහන් කරනු ලැබ ඇත. වෙබ් අඩවි වලකා දමා විපක්ෂයේ ආධාරකරුවන්ට ශාරීරිකව පහර එල්ල කර ඇත. මෙම ප්‍රජාතන්ත්‍ර විරෝධී විධික්‍රමවල ප්‍රධාන එල්ලය වන්නේ යුද්ධයට ආධාර කලා වූ ද රාජපක්ෂගේ වෙලඳපල වැඩපිලිවෙලට සහය දෙන්නා වූ ද ධනේශ්වර විරුද්ධ පක්ෂයන්ට නොවේ; ඇත්ත වශයෙන් ම මේවා වනාහි කම්කරු පන්තියට එරෙහි තීරනාත්මක සට්ටනයකට කෙරෙන සැලසුම් ය.

රාජපක්ෂ අතට දැනට ම මහත් බලයක් රැස් කර ගෙන ඇත. වත්මන් ව්‍යවස්ථාව යටතේ විධායක ජනාධිපතිවරයාට කැබිනට් තනතුරු දැරිය හැකිය. ආන්ඩුව විසුරුවා හැරිය හැකිය. පාර්ලිමේන්තුව විසුරුවා හැර නව මැතිවරන කැඳවිය හැකිය. විපක්ෂයේ පක්ෂ පාර්ලිමේන්තුව තුල බහුතරයක් අත්කර ගත්තද රාජපක්ෂ තම බලය අතහැර දමනු නැත. ගත වූ අවුරුදු හතර තිස්සේ ඔහු ඇත්ත වශයෙන් පාලනය කර ඇත්තේ, ආන්ඩුක්‍රම ව්‍යවස්ථාව ද උසාවි ද නීති පද්ධතිය ද එන්න එන්නම නොතකා හැර සිටින නෑදෑයින්, හමුදා ප්‍රධානීන් සහ සමීප උපදේශකයින්ගෙන් සමන්විත ජනාධිපති කල්ලියක් මගිනි. දැන් පාලක සභාගය ඉල්ලා සිටින්නේ හිතු මතේ ආන්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කල හැකි තුනෙන් දෙකේ බහුතරයකි.

නඩු විභාගයකින් තොරව අත්අඩංගුවේ තබා ගැනීමටත් මාධ්‍ය වාරනයටත් කම්කරු විරෝධතා ක්‍රියා තහනම් කිරීමටත් ඔහුට බලය දෙන හදිසි නීතිය තවමත් තබා ගෙන සිටී. දහස් ගනන් ජනයා දැනට "එල්ටීටීඊ සැකකරුවන්" යැයි හදිසි නීතිය යටතේ ද ඒ හා සම්බන්ධ ත්‍රස්තවිරෝධී පනත යටතේ ද සිරකරනු ලැබ සිටිති. රාජපක්ෂ පසුගිය ඔක්තෝබරයේ දී වරාය, විදුලිබල, ජල සම්පාදන සහ ඛනිජ තෙල් කම්කරුවන් වැටුප් වැඩි කිරීමක් ඉල්ලා ඇරඹූ කාර්මික ක්‍රියා වෘත්තිය සමිතිවල සහාය ලැබ තහනම් කර දැමීය. මහජනතාවට බරපතල ම අනතුරු හැඟවීම නම් ආන්ඩුවට පක්ෂ මිනීමරු කල්ලි විසින් සිය ගනනක් මරා හෝ අතුරුදහන් කර තිබිය දී ඒ පිලිබඳ වගකිව යුතු කවරෙකු හෝ හෙලිදරව් කර නොතිබීම ය.

ඡන්දයෙන් තෝරා පත් කරගනු නොලැබම රටේ දැවැන්ත මිලිටරි යන්ත්‍රය පාලනය කරන ගෝඨාභය රාජපක්ෂ පසුගිය සතියේ මැතිවරන රැලියක දී මෙසේ අවධාරනය කලේ ය: "ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාදාමය ඇතුලතින් හෝ පිටතින් බාධා නොමැතිව ඉදිරියට ගෙන යාම සඳහා පාර්ලිමේන්තුවේ තිරසර බහුතරයක ආධාරය සහිත ශක්තිමත් ආන්ඩුවක් තිබීම ප්‍රානසම වැදගත්කමක් දරයි." සැලසුම් පැහැදිලිය: ආන්ඩුව සූදානම් වන්නේ මැතිවරනය අවසන් වූ වහාම මර්දනකාරී ආර්ථික ප්‍රහාර එල්ල කරමින් ඕනෑම විරුද්ධත්වයක් යකඩ සපත්තුවලින් පාගාදැමීමට ය.

සමාජවාදී සමානතා පක්ෂය මෙම මැතිවරනය යොදා ගත්තේ ආන්ඩුව සූදානම් කරමින් සිටින්නේ කුමක් ද යන්න පිලිබඳව කම්කරු පන්තියට අනතුරු හැඟවීම සඳහා ද සමාජවාදී වැඩපිලිවෙලක් මත කම්කරු පන්තිය ස්වාධීනව බලමුලුගන්වා ගැනීම සඳහා ද ය. දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂය, සිංහල අන්තවාදී ජනතා විමුක්ති පෙරමුන යන විරුද්ධ පක්ෂවලට ආන්ඩුව සමග මතභේදයක් ඇත්තේ නැත. විවිධාකාර දේශපාලන මත දරන්නා වූ වෘත්තීය සමිති, කම්කරු පන්තිය රාජපක්ෂ ආන්ඩුවට එරෙහි අරගලයට පිවිසීම වලක්වා තිබේ. බොරු වම්මු එනම් නව සමසමාජ පක්ෂය (නසසප) සහ එක්සත් සමාජවාදී පක්ෂය (එසප) මෙම වෘත්තීය සමිති මගින් සහ විරුද්ධ පක්ෂ මගින් වැඩ කරන ජනතාවට ඔවුන්ගේ අයිතීන් ආරක්ෂා කරගත හැකිය යන භයානක මිත්‍යාව වගා කරති.

අන් රටවල කම්කරුවන් ශ්‍රී ලංකාවේ දැන් පැනනැගී ඇති අනතුරු හැඟවීම් නොතකා හැරීම දුරදිග නොබලා වැඩ කිරීමකි. රාජපක්ෂ ආන්ඩුව දැන් ලංකාව තුල යොදාගන්නා ඒකාධිපති වැඩ පිලිවෙල, හුදෙක් ඊනියා තුන්වන රටවල්වල පාලක පන්තීන්ට සීමා වූවක් නොවේ. "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" යන කඩතිරයට මුවා වී ලෝකය පුරාම පාලක පන්තීන් දැන් සූදානම්ව සිටින්නේ ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහි බරපතල ප්‍රහාරයකට ය.

මාර්තු 17 දා ග්‍රීක නය අර්බුදය පිලිබඳ සිය ප්‍රකාශය මගින් හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව මෙසේ පැහැදිලි කලේ ය: "මහ ජනතාව දැඩිසේ එරෙහි වන්නා වූ පියවරයන් ගත යුතු යයි බැංකු බලකර සිටින අතර, යුරෝපීය ධනපති පන්තියේ කොටස් ප්‍රජාතන්ත්‍ර පාලනය අතහැර දැමීමට සැරසෙමින් සිටිති. දැන් බැංකුවල කුරුමානම

බවට පත්ව ඇති රටවල් තුලම මීට අවුරුදු 35කට පෙර පාලනය කරන ලද්දේ ඒකාධිපති පාලකයන් විසින් බව සිහියට නගා ගත යුතුව ඇත. 1967 සහ 1974 අතර ග්‍රීසිය පාලනය කරන ලද්දේ මිලිටරි ජුන්ටාවක් විසිනි. එයට නේටෝ සංවිධානයේ ආධාරය ලැබුනි. පෘතුගාලයේ 1926 දී පිහිටුවනු ලැබූ ෆැසිස්ට් ඒකාධිපතිත්වය 1974 වන තෙක් පෙරලා දමනු ලැබු යේ නැත. ස්පාඤ්ඤයේ සිවිල් යුද්ධයෙන් ෆ්‍රැන්කෝ බලය අල්ලා ගෙන අවුරුදු 36කට පසුව 1975 ඔහුගේ මරනයෙන් ඉක්බිතිව ෆැසිස්ට් පාලනය හමාර කොට බටහිර වර්ගයේ ප්‍රජාතන්ත්‍ර පාලනයක් කරා මාරු වීම ආරම්භ කර ගත හැකි වූයේ නැත."

ශ්‍රී ලංකාවේ දැන් දරන හරිමින් පවත්නා සිද්ධීහු එම අනතුරු ඇඟවීමේ අර්ථභාරය අවධාරනය කරති. එසේම එවා තරයේ පෙන්නුම් කරන්නේ ලෝකය පුරාම කම්කරුවන් සමාජවාදය සඳහා ද බංකොලොත් ධනපති ක්‍රමය පෙරලා දැමීම සඳහා ද පොදු අරගලයකට ඒකරාශී වී ගත යුතු බවය.

කේ. රත්නායක

© www.wsws.org